# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,085 — 1960 මාර්තු 16 වැනි බදාදා — 16.3.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## මිල පාලන දැන්වීම්

අංක වී 59 දරණ මිල නියෝගය — සීනි

### 1950 අංක 29 දරණ මිල පාලන පනත

වවුනියා දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් ඩොනල්ඩ් මාටිනස් අන්තෝනියස් ස්පෙල්ඩවින්ඩ් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) වැනි වගන්තිය සමග කියවියයුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව :—

(i) අංක 11,960 සහ 1959 නොවැම්බර් 20 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක වී 54 සහ 1959 නොවැම්බර් 17 වැනි දින දරණ ආහාර මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල සුදු සහ කළු සීනි තොග වශයෙන් සහ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් 3 වැනි සහ 4 වැනි තීරවල සඳහන් මිළ ගණන් බව ද නියෝග කරමි.

(iii) වවුනියා දකුණු ආදයම් පාලක ප්‍රදේශය, නෙඩුන්කර්නි සහ මුලතිව් යන ප්‍රදේශ අඩංගු, වවුනියා දිස්ත්‍රික්කයේ සෑම ගමකම සිල්ලර වශයෙන් සීනි විකිණිය හැකි වැඩිම මිළ ගණන් 2 වැනි උපලේඛනයේ නියම කර ඇත. එම මිළ ගණන්වලට වැඩියෙන් කිසිම වර්ගයක සීනි සිල්ලර වශයෙන් නොවිකිණිය යුතුයි.

(iv) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා —

(අ) මෙහි පළමුවැනි උපලේඛනයේ විස්තර කරන ලද ඕනෑම සීනි ප්‍රමාණයක් කොයි අන්දමකට හෝ නැවත විකිණීම සඳහා විකිණීම හෝ, හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එක විට විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) මෙහි පළමුවැනි උපලේඛනයේ විස්තර කරන ලද සීනි හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස කොයි අන්දමකට හෝ විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(v) මෙහි පළමුවැනි උපලේඛනයේ විස්තර කරන ලද සීනි වර්ගයක්, තවත් වර්ගයක් සමග මිශ්‍ර කර හෝ වෙනත් බාල සීනි වර්ගයක් සමග මිශ්‍රකර කිසිම වෙළෙන්දෙකු විසින් නොවිකිණිය යුතු බවත්,

(vi) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් සෑම ප්‍රදේශයකම සීනි ප්‍රමාණයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ, යම්කිසි ස්ථානයක හෝ වාහනයක තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම සීනිවලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම සීනි සඳහා මෙම නියෝගයේ නියම කළ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට, එම භාජනයට සම්බන්ධකොට, එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම පාරිභෝගියෙකුට පැහැදිළිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත්,

(vii) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සීනි, සිල්ලර වශයෙන් විකුණන සෑම වෙළෙන්දෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ සීනි ප්‍රමාණය ;
(ඇ) විකුණූ සීනි ප්‍රමාණයට ගෙවූ මුදල ;
(ඈ) වෙළඳමේ සවභාවය : එනම්, තොග වශයෙන් ද ? සිල්ලර වශයෙන් ද ? අඩංගු කුයිතාන්සියක් දිය යුතු බවත් මෙයින් නියම කරමි.

1960 මාර්තු 14 වැනි දින පෙරවරු 10ට වවුනියාවේ කච්චේරියේදී අත්සන් තබන ලදී.

ඩී. ඇම්. ඒ. ස්පෙල්ඩවින්ඩ්,
වවුනියා දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර)
මිළ පාලක,

## 1 වැනි උපලේඛනය

| | 2 වැනි තීරය | 3 වැනි තීරය | | දුඹුරු සීනි | | 4 වැනි තීරය | | සුදු සීනි |
|---|---|---|---|---|---|---|---|---|
| | | ශුද්ධබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | | ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | | ශුද්ධබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | | ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
| 1. | වවුනියා නගරය ... ... | 61 33 | ... | 0 58 | ... | 68 53 | ... | 0 65 |
| 2. | මාන්කුලම් ... ... | 61 99 | ... | 0 58½ | ... | 69 19 | ... | 0 65½ |
| 3. | නෙඩුන්කර්නි ... ... | 62 22 | ... | 0 59 | ... | 69 42 | ... | 0 66 |
| 4. | මුලතිව් ... ... ... | 63 83 | ... | 0 60 | ... | 71 03 | ... | 0 67 |

## 2 වැනි උපලේඛනය

වවුනියා දිස්ත්‍රික්කයේ සෑම ගම්මුලාදෑනි වැසික්කියක් සඳහා නියම කරන ලද වැඩිම සිල්ලර මිළ ගණන් සෑම ගමක නම ඉදිරියෙන් පහත දක්වා ඇත.

| 1 වැනි තීරය<br>අංකය | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>දුඹුරු සීනි ශුද්ධබර රාත්තලක් සඳහා වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. | | 4 වැනි තීරය<br>සුදු සීනි ශුද්ධබර රාත්තලක් සඳහා වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|---|---|
| 1. | වවුනියා නගරයේ ගම්මුලාදෑනි කොට්ඨාශය, පුදුකුලම්, ආසිකුලම්, කල්ලිකුලම්, ඊරට්පෙරිය කුලම්, මඩුකන්ද සහ නෙලුක්කුලම් ගම් ඇතුළත් වවුනියා දකුණු ආදයම් නිළධාරි කොට්ඨාශය | 0 58 | ... | 0 65 |
| 2. | නාවට්කුලම් ගම්මුලාදෑනි කොට්ඨාශය, මරුතමඩු, රාසේන්තිරම්කුලම්, සූදුවෙන්තපුලාවු, මාමඩුව, උලුක්කුලම, වෙඩ්ඩිකුලම්, කප්පච් (වෙඩ්ඩිකුලම් ප්‍රදේශයේ මාන්කුලම් ගම හැර) යන ගම් ඇතුළත් වවුනියා දකුණු ආදයම් නිළධාරි කොට්ඨාශය | — | ... | — |
| | කනගරායන්කුලම්, මාන්කුලම්, ඔලුමඩු, පලයවාඩි සහ ආනන්තපුලියන්කුලම් යන ගම්මුලාදෑනි කොට්ඨාශයන්ට ඇතුළත් වවුනියා උතුරු ආදයම් නිළධාරි කොට්ඨාශය | — | ... | — |
| 3. | වාලවයිකකුලම්, වෙඩ්ඩිකුලම් (මාන්කුලම් ගම පමණයි) යන ගම්මුලාදෑනි කොට්ඨාශයන්ට ඇතුලත් වවුනියා දකුණු ආදයම් නිළධාරි කොට්ඨාශය | 0 58½ | ... | 0 65½ |
| | මරුතොටෙයි, නෙඩුන්කර්නි සහ පාලම්පාසි යන ගම්මුලාදෑනි කොට්ඨාශයන්ට ඇතුළත් වවුනියා උතුරු ආදයම් නිළධාරි කොට්ඨාශය | 0 59 | ... | 0 66 |
| 4. | මුලතිව් සහ වෙල්ලමුල්ලිවයිකාල් යන ගම්මුලාදෑනි කොට්ඨාශයන්ට ඇතුළත් මුහුදුබඩ පත්තු ආදයම් නිළධාරි කොට්ඨාශය | 0 60 | ... | 0 67 |
| 5. | කරුප්පඩ්ඩමුරිප්පු සහ කච්චිලයිමඩු යන ගම්මුලාදෑනි කොට්ඨාශයන්ට ඇතුළත් වවුනියා උතුරු ආදයම් නිළධාරි කොට්ඨාශය<br>අම්පලවාන්පොක්කනෙයි, පුතුකුඩියිරිප්පු, කුමුලාමුනෙයි, තන්නිඋෟත්තු සහ මුල්ලියාව ලෙයි යන ගම්මුලාදෑනි කොට්ඨාශයන්ට ඇතුළත් මුහුදුබඩ පත්තු ආදයම් නිළධාරි කොට්ඨාශය | 0 60½ | ... | 0 67½ |
| 6. | කොක්කුතොඩුවයි සහ කොක්කිලායි යන ගම්මුලාදෑනි කොට්ඨාශයන්ට ඇතුලත් මුහුදුබඩ පත්තු ආදයම් නිළධාරි කොට්ඨාශය | 0 61 | ... | 0 68 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය.

---

අංක වී. 58 දරණ මිළ නියෝගය — අතිරේක ආහාර ද්‍රව්‍ය

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### අවලංගු කිරීමේ නියෝගය

1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව, වවුනියා දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත්, ඩොනල්ඩ් මාටිනස් අන්තෝනියස් ස්පෙල්ඩ්වින්ඩ් වන මම,

(i) 1958 අගෝස්තු මස 29 වැනි දින අංක 11,508 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1958 අගෝස්තු 25 වැනි දින සහ අංක 50 දරණ අතිරේක ආහාර ද්‍රව්‍ය පිළිබඳ මගේ ආහාර මිළ නියෝගයද,

(ii) 1958 සැප්තැම්බර් 24 වැනි දින අංක 11,530 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1958 සැප්තැම්බර් 22 වැනි දින සහ අංක වී 51 දරණ සුදුදුරු පිළිබඳ මගේ ආහාර මිළ නියෝගයද,

(iii) 1958 නොවැම්බර් 7 වැනි දින අංක 11,580 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1958 ඔක්තෝබර් 21 වැනි දින සහ අංක වී 52 දරණ අර්තාපල් පිළිබඳ මගේ ආහාර මිළ නියෝගය, සහ

(vi) 1958 දෙසැම්බර් 16 වැනි දින අංක 11,617 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1958 දෙසැම්බර් 9 වැනි දින සහ අංක වී 54 දරණ අර්තාපල් පිළිබඳ මගේ ආහාර මිළ නියෝගයද,

මෙතැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 මාර්තු 14 වැනි දින පෙරවරු 10ට වවුනියාවේ කච්චේරියේදී අත්සන් තබන ලදී.

ඩී. ඇම්. ඒ. ස්පෙල්ඩ්වින්ඩ්,
වවුනියා දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර)
මිළ පාලක.

අංක වී 60 දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය (මයිසූර් පරිප්පු)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

වවුනියා දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් ඩොනල්ඩ් මාටිනස් අන්තෝනියස් ස්පෙල්ඩවින්ඩ් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) අංක 11,775 සහ 1959 ජූනි 15 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක 57 සහ 1959 ජූනි 12 වැනි දින දරණ මයිසූර් පරිප්පු පිළිබඳ මගේ ආහාර මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) මෙහි පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ දක්වන ලද මිළ ගණන්, දළබර හොණ්ඩරයක්, තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළගණන් බවද, දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශ ඉදිරිපිට 2 වැනි තීරයේ සඳහන් වැඩි කරන ලද මිළ ගණන්; එම 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ බවද,

(iii) මෙහි පළමුවැනි උපලේඛනයේ 3 වැනි තීරයේ දක්වන ලද මිළ ගණන්, ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බවද, දෙවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශ ඉදිරිපිට 3 වැනි තීරයේ සඳහන් වැඩි කරන ලද මිළ ගණන් එම 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල, සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බවද ;

(iv) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) මෙහි පළමුවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තර කරන ලද ඕනෑම ප්‍රමාණයක ද්‍රව්‍ය කොයි අන්දමකට හෝ නැවත විකිණීම සඳහා විකිණීම හෝ දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමකට හෝ එකවිට විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලැබේ.

(ආ) මෙහි පළමුවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තර කරන ලද ද්‍රව්‍ය දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස කොයි අන්දමකට හෝ විකිණීම සිල්ලරට විකිණීමක් ලෙස සලකණු ලබන බවත් ;

(v) පළමුවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක්, තවත් වර්ගයක් සමග මිශ්‍රකර කිසිම වෙළෙන්දෙකු විසින් මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරණු ලැබූ ප්‍රදේශවල නොවිකිණිය යුතු බවත් ;

(vi) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම 1 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ, යම්කිසි ස්ථානයක හෝ වාහනයක තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ද්‍රව්‍යයෙන් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයෙන් නියම කළ වැඩිම මිළ, උසින් අඟලකට වඩා අඩුනොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍ය සහ නියමිත වැඩිම මිළ ඕනෑම පාරිභෝගිකයෙකුට පැහැදිළිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත් ;

(vii) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා රාත්තල හෙවත් ''රා.'' යනුවෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද ;

(viii) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, මෙහි පළමුවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකුණන සෑම වෙළෙන්දෙකු විසින්ම, මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ ද්‍රව්‍යවල බර ප්‍රමාණය ;
(ඇ) විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද ? සිල්ලර වශයෙන්ද ?, යන වග අඩංගු කුවිතාන්සියක් දියයුතු බවත් නියම කරමි.

(ix) එවැනි ද්‍රව්‍යයක් විකුණන විට එය යම්කිසි දෙයක බහා හෝ ඔතා දෙන දෙයක් වෙතොත් එහි මිළත්, මෙහි 1 වැනි උපලේඛන්යේ 2 වැනි. සහ 3 වැනි තීරුවල සඳහන් මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1960 මාර්තු 14 වැනි දින පෙරවරු 10ට වවුනියා කච්චේරියේදී අත්සන් තබන ලදි.

ඩී. ඇම්. ඒ. ස්පෙල්ඩවින්ඩ්,
නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන,
වවුනියා. දිස්ත්‍රික්කය.

### පළමුවැනි උපලේඛනය

වවුනියා දකුණු (දෙමළ) ආදායම් නිලධාරි කොට්ඨාශය ; ආසිකුලම්, වවුනියා, නොච්චිමෝට්ටෙයි, නෙල්ලුකුලම් සහ පූදූකුලම්.

වවුනියා දකුණු (සිංහල) ආදායම් නිලධාරි කොට්ඨාශය ; මඩුකන්ද සහ ඊරට්පෙරියකුලම.

| | 1 වැනි තීරය | 2 වැනි තීරය | | 3 වැනි තීරය |
|---|---|---|---|---|
| අංකය | විස්තර | දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | | ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | මයිසූර් යරිප්පු— | රු. ශ. | | රු. ශ. |
| 1. | මයිසූර් පරිප්පු ඉන්දියා/පකිස්තානි... ... ... | 50 54 | ... | 0 51 |
| 2. | ඉතියෝපියාව, ඒඩනය, සිරියාව, ලෙබනනය, බුරුමය, සහ අනික් රටවල් | 71 54 | ... | 0 73 |

### දෙවැනි උපලේඛනය

| අංකය | 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන්, දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට, පහත සඳහන් ගණන්ද එකතු විය යුතුයි | | 3 වැනි තීරය<br>පළමුවැනි උපලේඛනයේ 3 වැනි තීරයේ සඳහන් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට පහත සඳහන් ගණන්ද එකතුවිය යුතුයි |
|---|---|---|---|---|
| | | රු. ශ. | | රු. ශ. |
| 1. | මරුදන්කුලම්, මරුදමඩු සහ රාසෙන්තිරම්කුලම් අඩංගු වවුනියා දකුණු (දෙමළ) ආදයම් නිලධාරි කොට්ඨාශය, මරුදමඩු හැර සූදුවෙන්ත පුලාවූ, උළුක්කුලම අඩංගු වවුනියා දකුණු (සිංහල) ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... ... | 0 25 | ... | 0 1 |
| 2. | පෙරියපුලියන්කුලම්, වාකයිකඩ්ඩිනාඹුළුක්කුලම් සහ වාලවයිතකුලම් අඩංගු වවුනියා දකුණු (දෙමළ) ආදයම් නිලධාරි කොට්ඨාශය ; වවුනියා දකුණු (සිංහල) ආදයම් නිළධාරි කොට්ඨාශයේ උලුක්කුලම වැයික්කයේ මරදමඩුව... ... ... .... | 0 50 | ... | 0 1 |

| | 1 වැනි තීරය | 2 වැනි තීරය | | 3 වැනි තීරය |
|---|---|---|---|---|
| අංකය | ප්‍රදේශය | පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන්, දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට, පහත සඳහන් ගණන්ද එකතු විය යුතුයි | | පළමුවැනි උපලේඛනයේ 3 වැනි තීරයේ සඳහන් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට පහත සඳහන් ගණන්ද එකතුවිය යුතුයි |
| | | රු. ශ. | | රු. ශ. |
| 3. | නෙඩුන්කර්නි, මාන්කුලම්, ඔලුමඩු, කනකරායන්කුලම් සහ පුලියන්කුලම් අඩංගු වවුනියා උතුරු ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... ... | 0 50 | ... | 0 1 |
| 4. | පරන්දන්, මනවාලන්පඩ්ඩමුරිප්පු, තාන්ඩුවාන් කච්චිලෙයිම්ඩු, ඌන්ජල්කඩ්ඩි අඩංගු වවුනියා උතුරු ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... ... | 0 75 | ... | 0 2 |
| 5. | මුල්ලියාවලෙයි, තුන්නිඌත්තු, මුලතිව් සහ වෙල්ලමුල්ලිවයිකාල් අඩංගු මුහුදුබඩ පත්තු ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... ... | 1 0 | ... | 0 2 |
| 6. | කුමුලාමුනෙයි, පුදුකුඩියිරිප්පු සහ අම්පලවාන් පොක්කනෙයි අඩංගු මුහුදු බඩ පත්තු ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... ... ... | 1 25 | ... | 0 2 |
| 7. | කොක්කිලායි සහ කොක්කුතොඩුවායි අඩංගු මුහුදුබඩ පත්තු ආදයම් නිළධාරි කොට්ඨාශය ... | 1 50 | ... | 0 3 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ ගණන් නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතා වැඩිම මිළ ගණන්ය.

---

අංක 63 දරන ආහාර මිල නියෝගය

**බියලි මිරිස්, කරවල සහ වියලි ඉස්සෝ**

## 1950 අංක 29 දරන ආහාර මිල පනත

### නියෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක තැන්පත් තම්බයියා සිවඥනම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමග කියවෙන 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් ආහාර මිළ නියෝග අද දින සිට මේ නියෝගයෙන් අවලංගු කරමි.

(i) 1960 පෙබරවාරි 1 දින සහ අංක 12,051 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1960 ජනවාරි 26 දින සහ අංක 61 දරණ වියලි මිරිස් පිළිබඳ ආහාර මිළ නියෝගය ;

(ii) 1960 පෙබරවාරි 1 දින සහ අංක 12,051 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1960 ජනවාරි 26 දින සහ අංක 55 දරණ කරවල සහ වියලි ඉස්සෝ පිළිබඳ ආහාර මිළ නියෝගය.

1960 මාර්තු 14 වන දින පස්වරු 4° ට හම්බන්තොට දී අත්සන් කරන ලදී.

ටී. සිවඥනම්,
නියෝජ්‍ය (ආහාර) මිළ පාලක,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

---

## විවිධ දැන්වීම්

වර්ෂ 1942 කේ අංක 31 දරණ ලංකා ජාතික කෞතුකාගාර ව්‍යවස්ථාවේ 9 වැනි ඡේදය යටතේ පැන වූ රීති අකුරෙන් වර්ෂ 1948 ක්වූ අප්‍රේල් මස 30 වැනි දින නිකුත් කරන ලද අංක 9,859 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, සංශොධිත 3 වැනි රීතිය අනුව යාපනේ පිහිටා ඇති ජාතික කෞතුකාගාරය 1960 මාර්තු 19 වැනි සෙනසුරාද පාර්ලිමේන්තු මැතිවරණය නිමිත්තෙන් වසා තබන බැව් මෙයින් දන්වනු ලැබේ.

ප. එ. ප. දැරණියගල,
ලංකා ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ.

1960 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දීය.